(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 23 දරන මහනුවර බෞද්ධ විද්‍යාපීඨය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 12 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 අගෝස්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **6.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 12 වැනි දින.]

එල්. ඩී.–ඕ. 48/56.

## මහනුවර බෞද්ධ විද්‍යාපීඨය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"මහනුවර බෞද්ධ විද්‍යාපීඨය"යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී ආයතනයට සම්බන්ධ සියලුම කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මහනුවර තැන්නකුඹුර ගුරුදෙනියේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම සුදුසු සහ අවස්ථානුකූල වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

**1**. මේ පනත 1999 අංක 23 දරන මහනුවර බෞද්ධ විද්‍යාපීඨය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහනුවර බෞද්ධ විද්‍යාපීඨය සංස්ථාගත කිරීම.

**2**. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට හා ඉන් පසුව මහනුවර බෞද්ධ විද්‍යාපීඨයේ (මෙහි මින් මතු "බෞද්ධ විද්‍යාපීඨය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් වන තැනැත්තන් හෝ මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් "මහනුවර බෞද්ධ විද්‍යාපීඨය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, මෙයින් එය එසේ සංස්ථාවක් බවට පත් කරනු ලැබේ. තව ද, එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) මහනුවර බෞද්ධ විද්‍යාපීඨය, පිරිවෙන්, භික්ෂූන් සඳහා පුහුණු ආයතන, පාසල් සහ අධ්‍යාපන ආයතන පිහිටුවා නඩත්තු කිරීමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) බෞද්ධ දර්ශනය සහ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ හා පිටරට වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම:

(ඈ) පෙරදිග භාෂා සඳහා අංශයන් පිහිටුවා පවත්වා ගෙන යාම;

(ඉ) ඉංග්‍රීසි වැනි ජාත්‍යන්තර භාෂා සඳහා අංශයක් පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඊ) ජාත්‍යන්තර වශයෙන් ධර්ම ප්‍රචාරය කිරීමේ කටයුතුවල යෙදීම;

(උ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තීය අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම ;

(ඌ) ශිෂ්‍යයන්ට කුඩාකර්මාන්තවල පුහුණුව ලබාදීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් උපකාර කිරීම;

(එ) ජනතාවට තාක්ෂණික විශේෂඥතාව ලබාදීම අරමුණුකොට ගෙන යම් කර්මාන්තයක, වෘත්තියක හෝ අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරත වීම සහ යම් කෘෂිකාර්මික, කාර්මික සහ ව්‍යාපාරික ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම සහ කරගෙන යාම, එවැනි ව්‍යවසායයන්, සඳහා යම් තැනැත්තකුට ආධාර සහ උපකාර කිරීම, පුහුණු කිරීමේ වැඩපිළිවෙලවල් පවත්වා ගෙන යාම සහ සේවා සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම:

(ඒ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ ලා නිරතවන භික්ෂූන් වහන්සේලාට, ස්වේච්ඡා සේවකයනට සහ වෙනත් තැනැත්තන්ට, ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම ;

(ඔ) පුස්තකාල පිහිටුවා පවත්වා ගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සළකනු ලබන වෙනත් සේවා සැළසීම ;

(ඕ) පුස්තකාල පිහිටුවා පවත්වා ගෙන යාම, පොත්පත්, සඟරා, දේශනා, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම;

(ක) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති හෝ සංවිධාන සමග සහයෝගී වීම සහ සහචර්ය වීම ;

(ග) ආයුර්වේද සහ දේශීය වෛද්‍ය විද්‍යා අධ්‍යයන කිරීමේ වැඩ පිළිවෙලවල් සහ ඒ සඳහා අධ්‍යයන උසස් අධ්‍යාපන ඩිප්ලෝමා සහ වෙනත් අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම සහ සැපයීම;

(ච) අධ්‍යාපනික කටයුතු කරගෙන යන යම් දේශීය හෝ විදේශීය තාක්ෂණික හෝ වෘත්තීය අභ්‍යාස ආයතනයක, අනුබද්ධ ආයතනයක් ලෙස හෝ සංවිධානයක නියෝජිතයකු ලෙස ක්‍රියා කිරීම : සහ

(ජ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික වන හෝ විය හැකි වෙනත් ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාරගැනීමේ හා එකතු කිරීමේ ද,

ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය, කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් සහ සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරුන් තිදෙනෙක්, ගරු ලේකම්, උපලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන දහ දෙනෙකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින්, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, පූජ්‍ය තෙරිපැහැ ශ්‍රී ධම්මානන්ද මාහිමිපාණෝ සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු අතර, උන්වහන්සේ ගෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල් ධුරයට උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයා උන්වහන්සේ විසින් නම් කරනු ලැබිය යුතුය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බෞද්ධ විද්‍යාපීඨයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ ද, මෙහි පළමු වන උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන් ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළුකර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම සඳහා ද සංස්ථාවේ නිලධරයන් සහ කළමනාකරණ කමිටුවේ බලතල, චර්යාව සහ කාර්ය සම්බන්ධයෙන් ද සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සංස්ථාවේ සේවකයන්ගේ චර්යාව, කාර්යය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම් සම්බන්ධයෙන් හා එහි පරමාර්ථ මුදුන්

පමුණුවා ගැනීම සම්බන්ධයෙන් ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ වෙනත් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත් විය යුතුය.

බෞද්ධ විද්‍යාපීඨය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති බෞද්ධ විද්‍යාපීඨයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට බෞද්ධ විද්‍යාපීඨයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් හා ලේකම් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂි කරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතුය.

සංස්ථාවේ අරමුදල.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10**. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇත්තේ ය. තවද, එවැනි සියලුම දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

## පළමුවන උපලේඛනය [5 (3) වගන්තිය]

### අධ්‍යක්ෂ මණ්ඩලය

**අධ්‍යක්ෂ ජනරාල් :** ගරු ගල්කැටිවල නන්දරතන හිමිපාණෝ
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් :** ගරු හරින්ද්‍රනාත් දුනුවිල මන්ත්‍රීතුමා
**සහකාර අධ්‍යක්ෂ ජනරාල් :**

1. සෙන් අල්විස් මහතා
2. එන්.කේ.ආර්. තිලකරත්න මහතා
3. බී.ඩබ්. සමරකෝන් මහතා

**ගරු ලේකම්:**
ජේ. බෝපිටියගේ මහතා

**ගරු උප ලේකම්:**
ආර්. එම්.ඩී.බී. ආනන්ද වීරසූරිය මහතා

**ගරු භාණ්ඩාගාරික:**
ජී.ඩී.එල්. ලීලාරත්න මහතා

**කාරක සභාව:**

1. පී. බී. රාංසිගොල්ල මහතා
2. නීතිඥ සෙනරත් ගල්කඩුව මහතා
3. රම්බංඩා ධම්දාස මහතා
4. කේ. ඒ. දිනපාල මහතා
5. ධම්දාස වීරරත්න මහතා
6. එන්. එච්. ජී. ධම්දාස මහතා
7. ඩබ්. එම්. රණතුංග බංඩාර මහතා
8. එම්. වී. එස්. සමරතුංග මහතා
9. ඩබ්. එම්. සෙනෙවිරත්න මහතා
10. මහින්ද ඒකනායක මහතා

අනෙකුත් සාමාජිකයෝ:

1. අ. වි. ද විජේවර්ධන මහතා
2. ඩබ්. කේ. ඩඩ්ලි ගුණතිලක මහතා
3. දයානන්ද වීරරත්න මහතා
4. හෙන්රි අමරසිංහ මහතා
5. ගාමිණී කලුආරච්චි මහතා
6. එම්. ඩී. නිමල්සිරි මහතා
7. බී. එච්. පෙරේරා මහතා
8 පී.ජී. එම්. කරුණාරත්න මහතා
9. එච්. ඩබ්. ජිනදාස මහතා
10. ටී. ගාමිණී ද සිල්වා මහතා
11. වෛද්‍යාචාර්ය කේ. කුෂපන මහතා
12. ඩී. ඊ. පතිරණ මහතා
13. ගාමිණී එස්. වෙත්තසිංහ මහතා
14. පී. ඩී. පී. පතිරණ මහතා
15. ඒ. සී. අබේවීර මහතා
16. අ. ගි. ස. දයාරත්න මහතා
17. අතුල සෙනෙවිරත්න මහතා
18 ඉන්දික ප්‍රේමදාස මහතා
19. එච්. එම්. දිසානායක මහතා
20. කුමාරසිංහ පතිරන මහතා
21. මෛත්‍රී අතුකෝරාල මහතා
22. පි. ය. ජ. සෙනෙවිරත්න මහතා
23. ඒ. ආර්. එම්. රත්නායක මහතා
24. බී. දොන් චන්ද්‍රසේන මහතා
25. එල්. ජී. ජයතිස්ස මහතා
26. බී. ජී. විජේරත්න මහතා
27. එච්. බී. සමරතුංග මහතා
28 සුනිල් පෙරේරා මහතා
29. පී. කේ. ජී. දසනායක මහතා
30. ඒ. බී. ඒකනායක මහතා
31. වෛද්‍ය බී. ඩී. එස්. ගුරුදෙනිය මහතා
32. වෛද්‍ය ජී. ඩබ්. කරුණාරත්න මහතා
33. යූ. ඒ. යසරත්න මහතා
34. එන්. එම්. නිශ්ශංක මහතා
35. ඒ. එස්. රත්නායක මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.